**ආඛ්‍යාන**narrations
**Volume 07 | Issue 01 | January - June 2022 | Article 08**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: director@cikcs.sab.ac.lk

# ශ්‍රී ලාංකේය කාන්තාව සමාජය තුළ සවිබල ගැන්වීමෙහිලා අධ්‍යාපනයේ දායකත්වය පිළිබඳ ස්ත්‍රීවාදී ඉතිහාස දෘෂ්ටියෙන් කෙරෙන විමසුමක්

**ඒ. එම්. එම්. චන්ද්‍රිකා**, ඉතිහාසය අධ්‍යන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
malanichandrika42@yahoo.com

**සාරසංක්ෂේපය**

පීතෘමූලික සමාජ සංදර්භය තුළ ප්‍රයෝගික වන දකුණු ආසියානු සමාජයන්හි කාන්තාවන් සවිබල ගැන්වීමෙහිලා අධ්‍යාපනයෙහි බලපෑම සුවිශේෂිත වශයෙන් ඉස්මතු වේ. කාන්තාවගේ සමාජ හැසිරීම, සමාජ විටිනාකම සමාජ වැදගත්කම, සමාජ ඇගයීම, පවුලේ තත්ත්වය පමණක් නොව ඇයගේ ආර්ථික ස්ථාවරත්වය පිළිබඳ තීරණාත්මක සාධකය වනුයේ අධ්‍යාපනයයි. ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ප්‍රගමනය තුළ අතීතයේ සිට වර්තමානය දක්වා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් අතර ප්‍රතිපත්තිමය වෙනස්කම්, හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මෙන්ම නිදහස් අධ්‍යාපන ක්‍රමවේදය කාන්තා අධ්‍යාපනය පුළුල්වීම කෙරෙහි බලපෑ බව ප්‍රත්‍යක්ෂ කාරණයකි. මෙම පසුබිම තුළ ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්‍රමය මෙරට කාන්තාවන්ගේ සමාජ සවිබල ගැන්වීමෙහිලා කෙතෙක් දායක වී තිබේ ද යන්න පිළිබඳ විමසා බැලීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණ වේ. නිදහසින් පසු කාලපරිච්ඡේදය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් හා ස්ත්‍රීවාදී න්‍යායයික ප්‍රවේශයෙන් ශ්‍රී ලාංකේය කාන්තාව සමාජමය වශයෙන් සවිබල ගැන්වීමෙහිලා අධ්‍යාපනයේ දායකත්වය හා වැදගත්කම පිළිබඳ පුළුල්ව වීමංසනය කිරීම කෙරෙහි මෙහි දී වඩාත් අවධානය යොමු කෙරේ. ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ප්‍රගමනය තුළ කාන්තාවන් සමාජමය වශයෙන් සවිබල ගැන්වීමෙහිලා අධ්‍යාපනයේ දායකත්වය විවිධ ආකාරයෙන් ඉස්මතු වේ. කුටුම්භ රක්ෂණයෙන් මෙන්ම ගෘහස්ථකරණයෙන් ඔබ්බට යමින් කාන්තාව සමාජානුයෝජන ක්‍රියාවලියට සක්‍රියව දායක කර ගැනීම උදෙසා අධ්‍යාපනය හරහා ලබාදෙන සියලු ක්ෂේත්‍ර පිළිබඳ දැනුවත්භාවය කාන්තාවට සමාජයේ ඉදිරි පියවරක් සනිටුහන් කිරීමට මනා පිටුවහලක් වූ බව පැහැදිලිය. එසේ වුව ද සමාජ යන්ත්‍රණය, සංස්කෘතික හා ආගමික ගතිකත්වය මෙන්ම පීතෘමූලික ආකල්ප මත සමාජ වෙනස්වීම, ඇතැම් සමාජ කණ්ඩායම් තුළ ප්‍රගමනයක් සනිටුහන් කළ ද ඇතැම් ආගමික හා සංස්කෘතික කණ්ඩායම් සම්ප්‍රදාය අතික්‍රමණය කිරීමට දක්වන මැලිකම නිසාම නූතනය වන විටත් කාන්තාවන් සමාජමය වශයෙන් ඉදිරියට ඒම මන්දගාමී ස්වරූපයක් පෙන්වන බව දැකිය හැකිය. එබැවින් ප්‍රතිපත්ති සම්පාදනය සහ ඉහළ මට්ටමේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය දක්වා සමාන සහභාගිත්වයක් කාන්තා ප්‍රජාව තුළින් ද නියෝජනය කිරීමේ අවශ්‍යතාව පූරණය කිරීමට අධ්‍යාපනය හරහා කාන්තාවට අවකාශ ලබාගැනීමට ඇති හැකියාව ඉස්මතු කිරීම ඉතා වැදගත් වේ.

**ප්‍රමුඛ පද:** *ස්ත්‍රීවාදය, ශ්‍රී ලාංකේය කාන්තාව, කාන්තා අධ්‍යාපනය, සමාජ සවිබල ගැන්වීම, කාන්තා ඉතිහාසය*

**හැඳින්වීම: අධ්‍යයන පසුබිම**

සංකල්පීය වශයෙන් සලකන විට අධ්‍යාපනය කෙනෙකුගේ උපතත් සමග ආරම්භ වී ඔහුගේ හෝ ඇයගේ අභාවයෙන් අවසන් වන ජීවිතය පුරාම පවතින ක්‍රියාදාමයකි. මානවයාගේ ජීවන පැවැත්ම තුළ නොනවතින ක්‍රියාදාමයක් ලෙස අධ්‍යාපනය ප්‍රායෝගික වන අතර මානවයාගේ අඛණ්ඩ වර්ධනය හා ප්‍රගමනය කෙරෙහි ගුණාත්මක වශයෙන් මෙන්ම ප්‍රමාණාත්මක වශයෙන් ද බලපානු ලබන වැදගත් ප්‍රපංචයකි. අධ්‍යාපනය ප්‍රධාන වශයෙන් දැනුම විෂයානුබද්ධතාව හා ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය යන ත්‍රිත්ව මාර්ගයන්ට මග විවර කරන ප්‍රධාන මූලයයි. පුද්ගයකු තම ස්වයං දැනුවත්භාවය හරහා නිවැරදි තීරණයන්ට ප්‍රවිශ්ට කරවන හා අන්‍යයන්ගේ තත්ත්වය නිවැරදිව අවබෝධ කර ගැනීමට අවශ්‍ය පොදු දැනුම අධ්‍යාපනය හරහා වර්ධනය කරනු ලැබේ. එබැවින් මානව සමාජයේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයටම සිය සමාජ තත්ත්වය පුළුල් විවිධත්වයක් කරා මෙහෙය වීමට අවැසි මාවත අධ්‍යාපනය තුළින් නිර්මාණය වන බව පැහැදිලි වේ. එබැවින් අනෙකුත් සමාජ යන්ත්‍රණයන් අතික්‍රමණය කරමින් අධ්‍යාපනය කාන්තාව සමාජමය වශයෙන් සවිබල ගැන්වීම කෙරෙහි දක්වන දායකත්වය අවිවාදාත්මකය. පීතෘ මූලික සමාජ සංදර්භයන් තුළ කාන්තාව සමාජමය වශයෙන් ඉදිරි පියවරක් කරා මෙහෙයවිය හැකි වැදගත්ම මෙවලම අධ්‍යාපනය යැයි දැක්වීම ද අතිශයෝක්තියක් නොවේ. මෙහි දී අධ්‍යයනයට බඳුන් කෙරෙන ප්‍රධාන පර්යේෂණ ගැටලුව වනුයේ කාන්තාවගේ සමාජ ප්‍රගමනය උදෙසා අධ්‍යාපයේ ඇති බලපෑම ඉස්මතු වන්නේ කෙසේ ද? යන්නයි. ඒ අනුව කාන්තාවගේ සමාජයීය ප්‍රගමනයෙහිලා අධ්‍යාපනයෙහි ඇති වැදගත්කම හා සහසබඳතාව න්‍යායාත්මකව අවධාරණය කිරීම මෙහි එක් පැතිකඩකි.

මෙම අධ්‍යයනයේ අනෙක් පැතිකඩ වනුයේ ස්ත්‍රීවාදී ප්‍රවේශය හා එහි සමාජ සංකතනයට සාපේක්ෂව කාන්තාව සවිබල ගැන්වීමෙහිලා න්‍යායික වශයෙන් ගොඩනැගී ඇති සාකච්ඡාව පිළිබඳ විමසා බැලීම යි. ස්ත්‍රවාදී අදහස් සමාජගතවීමට සාපේක්ෂව කාන්තාව පිළිබඳ වූ අධ්‍යයනයන් ස්ත්‍රීවාදී දෘෂ්ටියෙන් යුක්තව ඒ ඒ භූගෝලීය කලාපයන්ට කේන්ද්‍රගතව ඉදිරියට ඒම නූතන ලෝකය තුළ වඩාත් කැපී පෙනෙන ප්‍රවණතාවකි. ඒ අනුව පුරුෂ කේන්ද්‍රීය සමාජ සන්දර්භයන් ලෙස විග්‍රහ කෙරෙන ශ්‍රී ලාංකාව වැනි ආසියානු කලාපයේ රටවල් තුළ ද කාන්තාව පිළිබඳ අධ්‍යයන ධාරාව තුළ කාන්තාවගේ සමාජානුයෝජන ක්‍රියාවලිය, සමාජ සාරධර්මයන් හා සමාජයීය හර පද්ධතීන්, සංස්කෘතිකමය වටිනාකම් පමණක් නොව ඇගේ සමාජගතවීම ආදී වූ සියලු ක්‍රියාදාමයන් ගතානුගතික මෙන්ම සම්ප්‍රධායික ක්‍රමවේදයන් හා පදනම්ව තීරණය වූ සහ තීරණය වන්නා වූ පසුබිමක ස්ත්‍රීවාදී අදහස්වල බලපෑම යම් පමණකට හෝ ධනාත්මක පසුබිමක් නිර්මාණය කිරීමට දායක වූයේ යැයි හඳුනා ගැනීමට ඇති අවකාශ බොහෝ ය. සම්ප්‍රදායික සමාජ ක්‍රමවේදය තුළ ආර්ථික හා සමාජ තත්ත්වය, දේශපාලන නායකත්වය, තීරණ ගැනීමේ අයිතිය කාන්තාව තුළින් බැහැරකර තිබුණු ආසියානු කලාපයේ එකී ඍණාත්මක අදහස් ක්‍රමිකව සමාජයෙන් දුරස් කර කාන්තාවටද සිය පවුල තුළ මෙන්ම සමාජය තුළ වගකීම් දැරිය හැකි බව සහ සියලු අංශයන්හි ඇය ගේ දායකත්වය සමාජ සංවර්ධනයෙහිලා අත්‍යාවශ්‍යය බව පසක් කරලීමට ස්ත්‍රීවාදී අදහස් තුළින් ඉදිරිපත් කළ චින්තනමය පසුබිම හේතු වූ බව ද පෙනේ. තව ද ශ්‍රී ලාංකේය සමාජය තුළ ස්ත්‍රීවාදී අදහස්වල බලපෑමෙහි ප්‍රායෝගිකත්වය තුළ අධ්‍යාපනය හරහා කාන්තාවන් සමාජය තුළ සවිබල ගැන්වීමට ඇති හැකියාව වඩාත් ඉස්මතු වී තිබෙන බව ද දිවයිනේ ඓතිහාසික විකාශනය තුළ විද්‍යමාන වන වැදගත් තත්ත්වයකි. ඒ අනුව ශ්‍රී ලාංකේය සමාජයේ ඓතිහාසික විකාසනය තුළ විද්‍යමාන වන මෙම තත්ත්වය නූතන සමාජ යන්ත්‍රණය තුළ ද වඩාත් ප්‍රායෝගිකව ඉස්මතු වන බව දක්නා ලැබෙන අතර තවදුරටත් පුළුල් දිශානතියක් තුළ කාන්තා අධ්‍යාපනය වර්ධනය කිරීම හරහා ඇය සමාජය තුළ සවිබල ගැන්වීමට මනා පිටුවහලක් වනු ඇතැයි යන පූර්ව විනිශ්චයේ සිට මෙම අධ්‍යයනය සිදු කෙරේ. එමෙන්ම ශ්‍රී ලාංකේය කාන්තාවගේ ඉතිහාසය පිළිබඳ විවිධ පැතිකඩ ඔස්සේ මා විසින් සිදුකරන ලද පූර්වඅධ්‍යයනයන් හරහා හඳුනා ගන්නා ලද පර්යේෂණ අවකාශයක් ලෙස මෙම අධ්‍යයනය සිදු කෙරිණි.

**අධ්‍යයනයේ වැදගත්කම**

ප්‍රස්තුත මාතෘකාව වඩාත් පුළුල් ප්‍රවේශයක අධ්‍යයනය කිරීමහි වැදගත්කම කරුණු කිහිපයක් තුළ ඉස්මතු කර දැක්විය හැකිය. අතීත සම්ප්‍රදායික සමාජ සංවිධානය තුළ මෙන්ම නූතන සමාජ යන්ත්‍රණය තුළ ද කාන්තාවන් සමාජය තුළ සවිබල ගැන්වීමේ අවශ්‍යතාව සහ එහි වැදගත්කම සමාජ සංවර්ධනයෙහිලා අත්‍යාවශ්‍ය සාධකයක්ව ඉස්මතු වන බැවින් ඇය සමාජය තුළ සවිබල ගැන්වීමට අධ්‍යාපන සාධකය ඉවහල් වන ආකාරය අවධාරණය කිරීමට හැකි වීම ඒ අතර ප්‍රධාන වැදගත්කම ලෙස දැක්විය යුතු ය. එමෙන්ම මෙතෙක් කාන්තාව සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති අධ්‍යයනයන් මූලාශ්‍රයකරගනිමින් හා ඉදිරිපත්ව ඇති ස්ත්‍රීවාදී රචනාවන් ද පරිශීලනය කරමින් කරුණු විමර්ශනාත්මකව අධ්‍යයනයට ලක් කළ විද්වතුන් ඉදිරිපත් කර ඇති ස්ත්‍රීවාදී අදහස් මෙරට කාන්තා සමාජයේ ප්‍රගමනයට සහසම්බන්ධ වී ඇති ආකාරයෙන් ඉදිරියේ දී තවදුරටත් කාන්තාව ගේ සමාජ ප්‍රගමනය යථාවත් කිරීම සඳහා ලද හැකි දායකත්වය විමංසනයට ලක් කළ හැකි වීමත් ඒ තුළ කාන්තාව දේශපාලන, ආර්ථික හා සමාජ යන ව්‍යුහයන්හි සවිබල ගැනිවීමෙහිලා අධ්‍යාපනයේ වැදගත්කම ස්ත්‍රීවාදී කතිකාව තුළ ඉදිරිපත්ව ඇති ආකාරය සමාලෝචනයකට බඳුන් කිරීමට ඇති ඉඩකඩ විවර කර ගැනීමට හැකි වීමත් නිසා ශාස්ත්‍රීය වශයෙන් මෙන්ම ප්‍රායෝගික වශයෙන් ද මෙම අධ්‍යයනය වැදගත් වේ.

**සාහිත්‍ය විමර්ශනය**

කාන්තාව ගේ අධ්‍යාපනය හා සමාජ සවිබලගැන්වීම සම්බන්දයෙන් අවධානය යොමු කිරීමෙහි දී ඒ පිළිබඳව වන ශාස්ත්‍රිය අධ්‍යයනයන් ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ ප්‍රධාන අධ්‍යයන ධාරාවන් ද්විත්වයක් තුළ හඳුනා ගත හැකිය. එනම් ස්ත්‍රීවාදී දෘෂ්ටියෙන් රචිත කෘතීන් හා අධ්‍යාපන ක්‍රමය, අධ්‍යාපන ප්‍රතිපත්ති හා ඒවායෙහි ප්‍රායෝගිකත්වය කෙරෙහි ඍජු අවධානය යොමු කර ඇති කෘතීන් ද වශයෙනි. මේ අතර කාන්තා අධ්‍යාපනයේ වැදගත්කම හා එහි ශ්‍රී ලාංකේය ප්‍රායෝගිකත්වය පිළිබඳ කර ඇති පර්යේෂණ අතර ස්වර්ණා ජයවීර විසින් 1988, 1990, 1991, 1993, 1995, 1997 සහ 2002 වර්ෂයන්හි දී කර ඇති පර්යේෂණ වැදගත් වනුයේ කාන්තාව ගේ අධ්‍යාපන තත්ත්වය කෙරෙහි ගැඹුරු අවධානයක් යොමු කර ඇති බැවිනි. ඇය සිය පර්යේෂණ හරහා පෙන්වා දෙනුයේ වෙනත් රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගොඩනැගීමහි දී අධ්‍යාපන ක්‍රියාවලිය සහ එහි ප්‍රතිඵල දිගින් දිගටම බලපෑම් කරන බව යි[86]. අධ්‍යාපනය කෙරෙහි කාන්තාවන් සමාන ලෙසින් අවතීර්ණ වීම හරහා ඔවුන් සිය සාක්ෂරතාව ඉහළ මට්ටමකට පත් කර ගන්නා සේම සිය චින්තනයේ පුළුල්භාවය ඇති කරගන්නා බව අවධාරණය කරන ජයවීර තවදුරටත් පෙන්වා දෙන්නේ කාන්තාවන් සමාජමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා මෙන්ම සිය සමාජ තත්ත්වය ඉහල නංවා ගැනීම සඳහාත් අධ්‍යාපනය ප්‍රධාන මෙවලමක් වන බවයි[87]. තවදුරටත් ඇය සිය පර්යේෂණ හරහා අවධාරණය කරනුයේ අධ්‍යාපනික වශයෙන් කාන්තාව ලබන ඉදිරිය ඇයට වෘත්තීයමය අවස්ථා පුළුල් කර ගැනීමට ද ඉවහල් වන බවයි[88]. එමෙන්ම අධ්‍යාපනය කාන්තාවන් පවුල තුළත් ඉන් පිටත දීත් යම් පාලනයක් සහිතව කටයුතු කිරීමට අවශ්‍ය සංයමය ඇති කරලීම ද වැදගත් වේ. මේ අනුව ස්වර්ණා ජයවීර සිය පර්යේෂණ හරහා කාන්තාව සමාජමය වශයෙන් සවිබල ගැන්වීම කෙරෙහි ඇති බලපෑම පිළිබඳ සාකච්ඡා කර තිබෙන අතර තවදුරටත් මේ පිළිබඳ පර්යේෂණ කරන පර්යේෂකයින් සඳහා ශාස්ත්‍රීය ප්‍රවේශයක් ලබාදී තිබීම වැදගත් වේ. කුමාරි ජයවර්ධන විසින් රචිත; "Some Aspects of Feminist Consciousness in the Decade 1975-1985, In UN Decade for Women: Progress and Achivement of Women in in Sri Lanka, 1975-1985,"[89] (1985), සිල්වි තිරුචන්ද්‍රන් විසින් රචනා කරන ලද "Histoty, Trends and Trajectories"[90] වැනි ලේඛනයන් තුළ කාන්තාවන්

---

[86] Jayaweera, **Women and Education, Facets of Change: Women in Sri Lanka,** Colombo, CENWOR, 1995, p.108.
[87] **Ibid**, P. 124.
[88] **Ibid**.
[89] Jayawardana, K., Some Aspects of Feminist Consciousness in the Decade 1975-1985, In **UN Decade for Women: Progress and Achievement of Women in Sri Lanka**, 1975-1985, Colombo, CENWOR, 1985.
[90] Thiruchandran.,S.,**Women's Movement in Sri Lanka,** Colombo, Social Scientist Association, 2012.

සමාජයමය වශයෙන් සවිබල ගැන්වීමට මෙන්ම ඇගේ සමාජ තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැදගත්වන කරුණු කෙරෙහි අවධානය යොමු කර තිබෙන නමුත් ඒ තුළ සෘජු වශයෙන් මෙම ප්‍රස්තුතය පිළිබඳ සාකච්ඡා නොවීම තුළ නවක පර්යේෂකයින් සඳහා අවකාශයක් ඒ තුළින් ද නිර්මාණය වී තිබෙන බව පෙනේ.

එමෙන්ම අධ්‍යාපනය හා එහි වැදගත්කම පිළිබඳ කරන ලද අධ්‍යයනයන් තුළ ද මිනිසාගේ කුසලතා වර්ධනය හා දැනුම වර්ධනයට මෙන්ම පුද්ගලිකත්වය වර්ධනය සඳහා එහි වැදගත්කම අවධාරණය කර තිබේ[91]. සමාජ තත්ත්වය ඉහළ නැංවීම සඳහා මෙන්ම ආර්ථික හා දේශපාලනික වශයෙන් කාන්තාවගේ තත්ත්වය ඉහළ නැංවීම සඳහා අධ්‍යාපනයේ වැදගත්කම මෙහි දී වඩාත් අවධාරණය කර තිබේ. අධ්‍යාපනය මෙන්ම කාන්තාව යන තේමාවන් දෙකම පිළිබඳ සාකච්ඡා කරමින් තිලකා මෙත්තානන්ද විසින් සිදුකර ඇති පර්යේෂණ පත්‍රිකා තුළ ද සම්ප්‍රදායික සමාජයේ කාන්තාව පිළිබඳව තොරතුරු දක්වා තිබේ. එහි දී ඇය පෙන්වා දෙන්නේ සම්ප්‍රදායික සමාජයේ කාන්තාවන් ගෘහය තුළ සිය කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් අධ්‍යාපනයක් ලැබීම ප්‍රමාණවත්ය යන අදහසක් පැවති බව යි[92]. තව ද සිරිමා කිරිබමුණේ[93], වැනි ශ්‍රී ලාංකේය සමාජයේ කාන්තාව පිළිබඳ පර්යේෂණ සිදුකළ විද්වතුන් ගේ එම පර්යේෂණ තුළ ද සම්ප්‍රදායික සමාජයේ කාන්තාව පිළිබඳ පුළුල් විමර්ශනයන් කර ඇති අතර සාම්ප්‍රදායික සමාජ ආකල්ප තුළ කාන්තාවන් සමාජමය වශයෙන් සවිබලගැන්වීමට පැවති බාධාවන් පිළිබඳව ද එම අධ්‍යයන තුළ සාකච්ඡා වී තිබේ.

මේ අනුව ප්‍රස්තුත තේමාව හා සම්බන්ධයෙන් පවත්නා සාහිත්‍යය විමර්ශනය කිරීමෙහි දී එකම දිශානතියක් තුළ ප්‍රධාන වශයෙන් කාන්තාවන් සමාජමය වශයෙන් සවිබලගැන්වීම සඳහා අධ්‍යාපනයේ ඇති වැදගත්කම ශ්‍රී ලාංකේය කාත්තාව පාදක කර ගනිමින් දීර්ඝ ලෙස කරන ලද අධ්‍යයනයන් හිඟ වුව ද ඒ ඒ ක්ෂේත්‍ර තුළ කාන්තාව පිළිබඳ කර ඇති පර්යේෂණ තුළ ඒ පිළිබඳ සැකෙවින් හෝ අවධානය යොමුකර තිබීම තුළ ශාස්ත්‍රිය පදනමක් හා ප්‍රවේශයක් තුළ මෙම පර්යේෂණ පත්‍රිකාවට ප්‍රවිශ්ට වීමට හැකි වූ බව දැක්විය යුතු වේ.

**අධ්‍යයන ක්‍රමවේදය**

මෙහි දී අධ්‍යයන ක්‍රමවේදය වනුයේ පර්යේෂණ පත්‍රිකාව තුළ සාකච්ඡාවට බඳුන් කරන ප්‍රධාන ප්‍රස්තුතයට සෘජුවම අදාළ වන ප්‍රාථමික හා ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය තුළින් කරුණු අනාවරණය කර ගැනීම හා එම කරුණු අදාළ ලෙස විමර්ශනය කිරීමත් මෙන්ම ස්ත්‍රීවාදී න්‍යායික ප්‍රවේශය මූලික කර ගනිමින් කරුණු විග්‍රහ කිරීමත් ය. පර්යේෂණයේ දී අදාළ කරුණු ප්‍රාථමික මූලාශ්‍රය හා මෙතෙක් මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කර ඇති සෘජු පර්යේෂණ ග්‍රන්ථ පරිශීලනය මගින් සිදු කරන ලදි. මෙම පර්යේෂණ පත්‍රිකාවට අදාල ගුණාත්මක දත්ත විශ්ලේෂණය කිරීමෙහි දී මාතෘකාවට අදාළ තේමාවන් වර්ගීකරණය කරමින් ඒ ඒ තේමාවන්ට අදාළ ව විශ්ලේෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදි.

---

91 Fazilah, Zaharah, Azizah, Saran, & Noor, The Role of Education in Shaping Youth's National Identity", **Social and Behavioral Science**, 2011, pp.443-450.

92 Metthananda, T., Women in Sri lanka: Tradition and Change, In. S. Kiribamune and V. Samarasinghe, **Women at the Cross Road: A Sri Lankan Perspective,** Vikas Publishing House, New Delhi, 1990, pp. 41-71.

93 Kiribamune, S. **Reconciliation of Roles: Women, Work and Family Sri Lanka, ICES Sri Lanka Studies Series.** New Delhi: International Centre for Ethnic Studies in Association with NORAD and NAVRANG, 1993.

**සාකච්ඡාව**

**න්‍යායාත්මක විශ්ලේෂණය: ස්ත්‍රීවාදී න්‍යායික දෘෂ්ටිය සහ ශ්‍රී ලංකාවේ කාන්තාව**

කාන්තාවගේ සමාජ තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කරගත් දේශපාලන වැඩපිළිවෙලක් ලෙසින් ස්ත්‍රීවාදය අරුත් ගන්වා තිබේ[94]. තව ද ස්ත්‍රීවාදී ව්‍යාපාරය හුදෙක් සමාජ ව්‍යාපාරයක් පමණක් නොව, රාජ්‍ය ආයතනවලට දේශපාලන පක්ෂවලට සහ සමාජ ආකල්පවලට දැඩි ලෙස බලපෑම් කරන දේශපාලන බලවේගයක් ද විය[95]. කාන්තාවන්ට එරෙහිවන සියලුම ආකාරයේ වෙනස්කම් මෙන්ම ඇයට සමාජයේ හිමි වී ඇති අප්‍රධාන තත්ත්වය හා පීතෘ මූලික ආධිපත්‍යය තුරන් කිරීමේ අරමුණ ප්‍රමුඛ කරගත් දෘෂ්ටිවාදයක් ලෙසින් ද ස්ත්‍රීවාදය විග්‍රහ කර තිබේ. මෙම දෘෂ්ටිවාදය පිළිගන්නා මෙන්ම කාන්තාවන්ට හිමි අප්‍රධාන සමාජ තත්ත්වය වෙනස් කිරීමේ අරමුණ ප්‍රමුඛ කරගත් ක්‍රියාකාරකම් සඳහා දායකත්වය දක්වන පිරිස් ස්ත්‍රීවාදීන් ලෙස සැලකේ[96]. විශේෂයෙන්ම ස්ත්‍රීන්ගේ සමාජ තත්ත්වය ඉහල නැංවීම අරමුණු කරගත් ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරයෙහි ඉතිහාසය දහනවවැනි සියවසේ අගභාගය සහ විසිවන සියවසේ මුල භාගය දක්වා දිවෙයි[97]. මාරි වොලස්ටන්ක්‍රාෆ්ට් විසින් (Mary Wollstonecraft) රචිත *A Vindication of the Rights of Woman* කෘතිය රචනා කිරීමත් සමඟ කාන්තාවන්ට සම අයිතිවාසිකම් ඉල්ලා සිටීමේ ව්‍යාපාර යුරෝපා සමාජය තුළ ඇරඹිණ[98]. නමුත් සංවිධානාත්මක ශක්තිමත් සමාජ ව්‍යාපාරයක් ලෙස ස්ත්‍රීවාදී ව්‍යාපාරය ආරම්භ වූයේ 1830 ගණන්වල උතුරු ඇමරිකානු ස්ත්‍රීන් වහල්භාවයට එරෙහිව පෙළගැසීමත් සමගය[99]. එමෙන්ම ස්ත්‍රීවාදී න්‍යායෙහි අරමුණු අතර ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව කාන්තාවගේ දේශපාලන හා සමාජ සමානාත්මතාව ස්ථාපනය කිරීම ප්‍රමුඛ වන බව ආසියාතික සමාජයෙහි ස්ත්‍රීවාදී ව්‍යාපාරය තුළ කැපී පෙනෙනු දක්නට ලැබේ. මූලිකව බටහිර සමාජය තුළ ඉස්මතු වී පසුව ආසියාතික කලාපයේ රටවල් තුළට ව්‍යාප්ත වූ ස්ත්‍රීවාදය ආසියාතික සමාජය තුළ සංස්ථාගත වූයේ එකී සමාජයන් තුළ ස්ථාපිතව තිබූ පුරුෂකේන්ද්‍රීය සමාජ ක්‍රමවේදයට එරෙහිව නැගී සිටීම අරමුණු කරගෙන බව ද පැහැදිලි වේ. ඒ අනුව ආසියාතික සමාජයේ බොහොමයක් විද්වතුන්, ලේඛකයින් ස්ත්‍රීවාදී අදහස් තම සමාජයෙහි ස්ථාපිතව පැවති පුරුෂ කේන්ද්‍රීය අදහස් නව මානයකින් යුතුව විශ්ලේෂණය කිරීමට හා විවේචනාත්මක දෘෂ්ටියෙන් යුතුව සමාජයේ කාන්තාවගේ තත්ත්වය පිළිබඳ අවධාරණය කිරීමට උපයෝගී කරගෙන තිබෙනු දැකිය හැකිය. විශේෂයෙන්ම ආසියාතික සමාජයේ ඓතිහාසික විකාසනය කෙරෙහි අවධානය යොමුකිරීමේ දී කාන්තාවගේ සමාජ තත්ත්වය පිළිබඳ කාරණය සාකච්ඡාවට බඳුන් වී තිබෙනුයේ ඇය සමාජ, ආර්ථික හා දේශපාලනික වශයෙන් අවම තත්ත්වයක් තුළ ජීවත් වූ බව පසක් කරවමිනි. සමාජයීය නිදහස සමානාත්මතාව හිමිකම් ආදීය පිළිබඳ අවම දැනුමකින් යුක්තව සිටි පිරිසක් වශයෙනි. මෙකී පසුබිම තුළ ශ්‍රී ලාංකේය කාන්තාව තමා ජීවත්වන සමාජය පිළිබඳ දැනුම මෙන්ම ගෘහස්ථ ක්‍රියාකාරීත්වයෙන් ඔබ්බට ගොස් කාන්තාවට ද සමාජමය වශයෙන් ඉටුකළ හැකි භූමිකාවක් පවතින බව ප්‍රායෝගික වශයෙන් සනාථ කරමින් ඒ පිළිබඳ වූ දැනුම සමාජගත කිරීමට ස්ත්‍රීවාදී රචනාවන්ට හැකි වූ බව පැහැදිලිව දැකගත හැකිය. විශේෂයෙන්ම 1970 න් පමණ පසු කාලය තුළ ඉදිරියට ආ රචනාවන් තුළ මෙම ප්‍රවණතාව වඩාත් ප්‍රායෝගික වූ බව දැකිය හැකිය. සමාජමය වශයෙන් පවත්නාවූ සම්ප්‍රදායික සමාජ රටාව මෙන්ම සංස්කෘතිය හරහා ගොඩනගාගෙන තිබූ ගතිකත්වයන්ට ආමන්ත්‍රණය කළ හැකි පසුබිමක් නිර්මාණය කරමින්, ආර්ථිකමය වශයෙන් කාන්තාවට උරුමව පැවති දෙයාකාරී වූ ක්‍රියා පිළිවෙත එනම්, ගෘහස්ථ ක්‍රියාවලිය හා වෘත්තීයමය ක්‍රියාවලිය තුළ ඇය ලද පීඩනය මෙන්ම එක හා සමාන වෘත්තීයමය දායකත්වයට ඇය පුරුෂයින්ට වඩා අඩු වැටුපකට හිමිකම් කීමේ තත්ත්වයට එරෙහිව හඬක් නගමින්, හා දේශපාලනය තුළ කාන්තා නියෝජනය වැඩි කරමින් ඇගේ ගැටලු

---

[94] Campbell, A. Feminism and Evolutionary Psychology. New York: Oxford University Press, 2006.

[95] ලියනගේ, කමලා, දේශපාලන විද්‍යාව හා ස්ත්‍රීවාදය: න්‍යායාත්මක විශ්ලේෂණයක්, **සම්භාවනා,** ශාස්ත්‍රපීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 2008, පි. 4.

[96] ලියනගේ, **එම,** 2008, පි.5.

[97] **එම.**

[98] Wollstonecraft, M. **Vindication of the Rights of Women.** New York: W.W.Norton, 1975.

[99] ලියනගේ, එම, 2008, පි.5.

ඇගේ හඬින් සමාජගත කරන්නට අවැසි පසුබිම නිර්මාණය කරන්නට මෙරට තුළ ස්ත්‍රීවාදී ක්‍රියාකාරකම් මෙන්ම රචනාවන් යම් පමණකට හෝ ප්‍රායෝගික දායකත්වයක් සැපයූ බව නොරහසකි.

ශ්‍රී ලාංකේය සංදර්භය තුළ කාන්තාවාදී අදහස්වල ප්‍රායෝගික ව්‍යාප්තිය 1960 හා 1970 වැනි කාල පරිච්ඡේදයෙහි වඩාත් තිව්‍ර වූ බවක් දැකගත හැකිය. එම ව්‍යාප්තිය තුළ වඩාත් අවධානයට පාත්‍ර වූයේ සමාජ, ආර්ථික හා දේශපාලන ව්‍යුහයන්හි කාන්තාවගේ සහභාගිත්වය සහ එකී ප්‍රධාන ධාරාවන් තුළ ඇයගේ නියෝජනය ඉහළ නැංවීමයි. ඒ අනුව බටහිර සමාජය තුළ ගොඩනැගුන සහ ලේඛනයන් තුළ අන්තර්ගතව තිබූ අරගලකාරී සහ විප්ලවවාදී ස්වරූපයට වෙනස් ප්‍රවේශයක් ගත් මෙරට කාන්තාවාදී ව්‍යාපාරය කාන්තාව සිය සමාජ අයිතීන් හා වගකීම් පිළිබඳ දැනුවත් කිරීමේ හා ඇය සමාජයට වඩාත් සමීප කිරීමට ගත් උත්සාහයක් ලෙස දැක්වීම උචිතය. මන්ද යත් බටහිර සමාජයේ කාන්තාව මුහුණ දුන් තත්ත්වයෙන්ම ගැටලුකාරී තත්ත්වයක් ආසියානු කාන්තාවට නොපැවති බැවිණි[100]. තව ද පුරුෂ කේන්ද්‍රීය සමාජ ක්‍රමවේදය ලෝකයේ බෝහෝ රටවල පැවතිය ද කලාපීය වශයෙන් හා රටවල් වශයෙන් වෙන්ව ගත් විට කාන්තාව මුහුණ දුන් ගැටලු සමාන නොවූ බැවිණි. එබැවින් ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ අරමුණු සහ ප්‍රායෝගික මුහුණුවර කලාපීය වශයෙන් උද්ගතව තිබූ තත්ත්වයන්ට අනුකූලව වෙනස් වූ ස්වරූපයන්ගෙන් ඉදිරිපත් වූ බව පැහැදිලිය. මෙම තත්ත්වය ශ්‍රී ලාංකේය සමාජය තුළ ඉස්මතු වූ ආකාරය ඒ ඒ ක්ෂේත්‍රයන්ට අනුගතව විමංසනය කර බැලීම වඩාත් උචිත ය.

ශ්‍රී ලාංකේය සමාජයේ කාන්තාවගේ සමාජ, ආර්ථික හා දේශපාලන තත්ත්වය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ඒ ඒ සංස්කෘතීන් හරහා ගොඩනගා තිබූ සමාජ යන්ත්‍රණය තුළ කාන්තාවට හිමි කර දී තිබෙන ස්ථානය හැම විටම දෙවන තැන පිහිටුවා තිබීම මෙන්ම සමාජය තුළ ඇගේ වටිනාකම ගෘහස්ථ කාර්යයන් තුළට පමණක් සීමා කිරීම පැහැදිලිව දක්නට ලැබිණි. එමෙන්ම මෙකී යන්ත්‍රණය තුළ විවාහයේ දී කාන්තාවන් විසින් දෑවැදි ක්‍රමයට යටත් කර තිබීම තුළ ද ඇය දැඩි සමාජ පීඩනයකට නතු කර තිබූ බව ද දක්නට ලැබිණි. ආර්ථිකමය වශයෙන් ඇයට හිමි වූයේ ද සමාජ තත්ත්වයට සමාන වූ තත්ත්වයකි. අධ්‍යාපනික වරප්‍රසාද ලත් හා සුදුසුකම් ලත් පිරිස් හැරුණු විට උසස් තත්ත්වයේ වෘත්තීන් සඳහා කාන්තාවට තිබූ ඉඩ අවම විය. දේශපාලනය තුළ ද පැවතියේ ඒ හා සමාන තත්ත්වයකි. ඉතිහාසය පුරාවට මේ තත්ත්වය පිළිබඳ කළ විමර්ශනයන් මෙන්ම සංඛ්‍යාත්මක වශයෙන් ඉදිරිපත් කළ දත්තයන් තුළ ප්‍රායෝගික වශයෙන් මෙම තත්ත්වය වෙනසකට බඳුන් කිරීමට සුළු හෝ දායකත්වයක් ලබා දීමට ස්ත්‍රීවාදී ව්‍යාපාරයට හැකි වූයේ යැයි කීම අතිශයෝක්තියක් නොවන නමුත් නිදහසින් පසුව දිවයින තුළ ඇති වූ සමාජ ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රයන්හි වෙනස්වීම් මෙන්ම නවතාවයන් ද ඒ සඳහා පදනම් වූ බව කිව යුතුය. එමෙන්ම දහනව වන සියවසේ සහ විසිවන සියවසේ මුල් කාල වකවානුව තුළ ඇති වූ සමාජ ආගමික, ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණයන් ද ශ්‍රී ලාංකේය කාන්තාව සමාජය තුළ ඉදිරියට ගෙන එනු ලැබිණි[101].

**ශ්‍රී ලාංකේය කාන්තාව සමාජය තුළ සවිබල ගැන්වීමෙහිලා අධ්‍යාපනයේ බලපෑම**

සමාජ සවිබලගැන්වීම පිළිබඳ විමංසනයේ දී ඒ පිළිබඳ සංකල්පනය විද්වතුන් විසින් විවිධ පැතිකඩ ඔස්සේ සාකච්ඡාවට බඳුන් කර තිබෙන බවක් දැකිය හැකිය. බලගැන්වීම පිළිබඳ අදහස විමර්ශනය කළ ඇතැම් විද්වතුන් එම විග්‍රහය තුළට "බලය" "කාවැද්දීම" වැනි අදහස් ද අන්තර්ගත කරන අතර ද්‍රව්‍යාත්මක දේ පිළිබඳ මෙන්ම දැනුම, දෘෂ්ටිවාද හා ප්‍රාග්ධන පාලනය ආදී බොහෝ අංශ ඒ තුළ සාකච්ඡාවට බඳුන් කර ඇති බව පෙනේ[102]. එමෙන්ම තීරණ ගැනීම, සංවිධානාත්මකව කටයුතු කිරීම මෙන්ම ජීවිත වඩාත් සංවිධිත කරගැනීම

---

[100] Kiribamune, S., op-cit, 1993.

[101] Jayawardana, K., & De Alwis, M. The contingent Politics of the Women's Movement in Sri Lanka after Independence, Jayaweera S. (Ed.), **Women in post-Independence Sri Lanka.** New Delhi: Sage Publication, 2002.

[102] Batliwala, S. (1994). The Meanings of Women Empowerment: New Concepts for Action. In G. Sen, **Population Policies Reconsidered: Health Empowerment and Rights**, Harvard: Harvard University Press.1994, pp. 130-131

හා තව කෙනෙකුගේ ජීවිතයේ ඇතිවන වලාත්‍යතාවන් අධීක්ෂණය කිරීම සවිබල ගැන්වීමෙහි ප්‍රධාන මානයන් වශයෙන් හුරුපුරුදු වන බවද දක්වා තිබේ[103]. බුද්ධිමය වශයෙන් යමෙකු සවිබල ගැන්වීම යනු පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට ඔවුන්ගේ ජීවිත කෙරෙහි බලපාන ගැටළු පාලනය කිරීම සඳහා සහාය වන ක්‍රියා පටිපාටියක් ලෙස විස්තර කරන[104] අතර පුද්ගලයෙකුගේ ස්වයං පාලනය බලගැන්වීම සඳහා විකල්පයක් ලෙස භාවිත කරන බවත් එයින් අදහස් කරනුයේ යමෙකු බාහිර පීඩනයකින් තොරව තීරණ ගැනීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට යම් පාලනයක් ඇති කළ හැකි වීම බව ද සඳහන් කර තිබේ[105]. කාන්තාව සමාජමය වශයෙන් සවිබල ගැන්වීම පීතෘමූලික්තවයට අභියෝග කිරීමේ පටිපාටියක් ලෙසින් ද නිරීක්ෂණය වී ඇති අතර ස්ත්‍රීන් සවිබල ගැන්වීමේ අරමුණ පුරුෂාධිපත්‍යය චින්තනයට අභියෝග කිරීමක් ලෙස ද විස්තර කර තිබේ. එමෙන්ම ස්ත්‍රී පුරුෂ භේදය හා සබැඳිව ගොඩනැගී ඇති සමාජ විසමතාව පවුල, පංතිය, කුලය හා ආගම යන ව්‍යූහයන්හි වඩාත් ඉස්මතු වන අතර එම තත්ත්වය යම් පරිවර්තනයකට ලක්කිරීමට කාන්තාව සමාජ වශයෙන් සවිබල ගැන්වීමෙහි අවශ්‍යතාව ද මේ තුළ සාකච්ඡාවට බඳුන්ව තිබේ. විශේෂයෙන්ම ස්වාධීනත්වය පිළිබඳ අදහස එහිදී වඩාත් අවධාරණය කරන අතර ස්වාධීනත්වය හා සමාජ සවිබලගැන්වීම පිළිබඳ සංකල්ප අතර යම් සමානත්වයක් පෙන්නුම් කරන නමුත් කාන්තාවන් සම්බන්ධයෙන් සලකන විට ඔවුන්ගේ ජීවිත පිළිබඳ වුව ද පාලනයේ හැකියාව හා මට්ටම නිරන්තරයෙන් උච්ඡාවචනයට බඳුන් වන බව අවධාරණය කර තිබේ. විශේෂයෙන්ම කාන්තාවන් මුහුණ දෙන ගැටලුවලට හා ඔවුන්ගේ ජීවිතවල ඇතිවන වලාත්‍යතාවන් පාලනය කර ගැනීමට යම් පිටිබලයක් ලෙස ඔවුන් සවිබල ගැන්වීමේ වැදගත්කම ද අවධාරණය වී තිබේ. එහි දී කාන්තාව සමාජ, ආර්ථික, දේශපාලන යන ප්‍රධාන ව්‍යූහයන් තුළ සවිබල ගැන්වීමහිලා ප්‍රධාන මෙවලම ලෙසින් අධ්‍යාපනික වශයෙන් ඔවුන් දිරිගැන්වීමහි අවශ්‍යතාව ද වඩාත් ඉස්මතු කර තිබේ. කාන්තාවන්ට තම ජීවන මට්ටම ඉහළ නංවා ගැනීමටත් තම ජීවිත පිළිබඳ බුද්ධිමය වශයෙන් තීරණ ගැනීමේ අවකාශය ඉහළ නැංවීමටත් අධ්‍යාපනය තුළින් ලැබෙන අනුබලය සුවිශේෂිත වන බව පැහැදිලිය.

මෙම පසුබිම තුළ ශ්‍රී ලාංකේය කාන්තාව සමාජමය වශයෙන් සවිබල ගැන්වීම පිළිබඳ සාකච්ඡාව කෙරෙහි අවධානය යොමු කිරීමෙහි දී මෙරට කාන්තා සංවර්ධනය හා සවිබල ගැන්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තියහි එක් අරමුණක් වූයේ කාන්තාවන්ට තමන් තුළ ඇති හැකියාවන් පිළිබඳ අවබෝධය ඇති කිරීමට මඟ විවර කිරීමයි. ඒ සඳහා ප්‍රධානතම මාධ්‍ය ලෙස අවධාරණය කරනු ලැබූයේ අධ්‍යාපනයයි. විශේෂයෙන්ම සමාජ, ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රවල කාන්තාවන් මැදිහත්වීම ආරක්ෂා කිරීම කර ගැනීම සඳහා අධ්‍යාපනයේ අත්‍යාවශ්‍ය බව හඳුනා ගන්නා ලදි[106]. එපමණක් නොව ශ්‍රම වෙළඳපල තුළ කාන්තාවන්ට ද ගැටලුවකින් තොරව සහභාගී වීම සඳහා අධ්‍යාපනයේ ඇති වැදගත්කම ද මෙහි දී අවධාරණය කර තිබේ. ශ්‍රී ලාංකේය සමාජයේ සාක්ෂරතාව ඉහළ අගයක පැවතිය ද බොහොමයක් කාන්තාවන් ගෘහයට සීමා වීම පිළිබඳවත් ඒ තුළ ඇතැම් කාන්තාවන් ගෘහස්ථ හිංසනයට මුහුණ දෙන බවත් ප්‍රායෝගික වශයෙන් අත්දකින තත්ත්වය බව ද බොහෝ දෙනාගේ අවධානයට යොමුව තිබෙන බව ද දැකිය හැකිය. ඒ අනුව පවතින අධ්‍යාපන ක්‍රමය කාන්තාව සමාජමය වශයෙන් බලගැන්වීම කෙරෙහි බලපාන ආකාරය හා ඒ තුළ අධ්‍යාපනයේ වටිනාකම වඩාත් අවධාරණය කිරීමට සහේතුක වන කරුණු කෙරෙහි තවදුරටත් අවධානය යොමු කිරීම වැදගත් වේ.

පීතෘමූලික සමාජ ක්‍රමවේදය තුළ පහළ අගයක් ගෙන ඇති කාන්තාවන්ගේ සමාජ තත්ත්වය ඉහළ නැංවීම සඳහා ප්‍රධාන වශයෙන් අධ්‍යාපන තත්ත්වය බලපාන බව ප්‍රත්‍යක්ෂ කාරණයකි. ගෘහස්ථකරණයෙන් ඔබ්බට කාන්තාව සමාජයීය ක්ෂේත්‍ර තුළ බලගැන්වීමට අධ්‍යාපනය තුළින් ඇය ලබන දැනුවත්භාවය ඉතා වැදගත් ය. පීතෘමූලික සමාජ ක්‍රමවේදය තුළ කාන්තාව මුහුණදෙන අභියෝගයන් හා එම අභියෝගයන් අතික්‍රමණය කිරීමෙහිලා සමාජ සමානත්වය පිළිබඳ අදහස සමාජගත කිරීමහි වැදගත්කම ස්ත්‍රීවාදී අදහස් හරහා අවධාරණය

---

103 Ibid., Wallter,S., and Manicom, L. **Gender in Popular Education in Transactional debates, Building Pedagogies of Possibility**, Palgrave Macmillan, 2012,
104 Gibson, C., **A Concept Analysis of Empowerment. Journal of Advanced Nursing,** 1991, pp.354-361.
**105 Ibid.**
106 Jayaweera, 2002, pp. 99-142.

කර තිබෙන අතරම කාන්තාවන්ට මූලික වශයෙන් ඇයගේ සමාජ වගකීම තේරුම් ගැනීමෙහිලා අධ්‍යාපනයේ වැදගත්කම ද අවධාරණය කර තිබේ. එක් පැත්තකින් ආකල්ප වර්ධනය මෙන්ම සමාජය පිළිබඳ පුළුල් දැනුවත්භාවයක් ඇතිකරීමටත් කාන්තාවගේ අනන්‍යතාව ගොඩනැගීමත් සංස්කෘතිකමය වශයෙන් ඉදිරිපත්ව ඇති පසුගාමී ආකල්ප බැහරකරමින් හා ඒ හරහා උද්ගත වී ඇති අභයෝගයන්ට සාර්ථක ලෙස මුහුණ දීමටත් කාන්තාවට අධ්‍යාපනය තුළින් ලැබෙන ශක්තිමත් එළඹුම ඇය සමාජමය වශයෙන් බලගැන්වීම සඳහා පදනම සකස් කරන බව පැහැදිලිය. උසස් ජීවන මට්ටමක් ගොඩනංවා ගැනීමටත් ඉහළ ආර්ථික ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමටත් දේශපාලනය තුළ ශක්තිමත් පදනමක් ගොඩනගා ගැනීමටත් මෙන්ම සමස්ත සමාජයටම බලපැවැත්වෙන තීරණ ගන්නා ආයතන තුළ සමාජයේ ප්‍රධාන කණ්ඩායමක් ලෙස කාන්තාව සමාන පදනමක් සහිතව නියෝජනය කිරීමටත් ඇයට ඇති හැකියාව පිළිඹිබු කළ හැකි ශක්‍යතාව ගොඩනගන මෙවලම ලෙස අධ්‍යාපනය දැක්විය හැකිය. එම තත්ත්වය ආසියාතික සමාජ යන්ත්‍රණය තුළ ප්‍රායෝගික කිරීමට කාන්තා ක්‍රියාකාරීන් දක්වන ලද දායකත්වය ද ඇගයිය යුතුය.

**කාන්තාවගේ අධ්‍යාපනික වර්ධනය කෙරෙහි ස්ත්‍රීවාදී අදහස්වල බලපෑම**

අධ්‍යාපනය ඉහළ නැංවීම හරහා කාන්තාව සමාජයේ සියලු අංශයන්හි සවිබල ගැන්විය හැකි බව කාන්තා ක්‍රියාකාරීන්ගේ ප්‍රබල අදහසක් විය. කාන්තා ක්‍රියාකාරීන් පමණක් නොව බොහෝ ක්ෂේත්‍රයන් නියෝජනය කළ විද්වතුන් සමාජ විසමතාව දුරස් කිරීම සඳහා අධ්‍යාපනයෙහි වැදගත්කම අවධාරණය කර තිබේ. සමාජ පාලක කාරකයක් වශයෙන් අධ්‍යාපන භූමිකාවෙහි වැදගත්කම බර්න්ස්ටීන්[107] හා බෝඩෝ[108] වැන්නන් පෙන්වා දී ඇති බව සඳහන් කරන ස්වර්ණා ජයවීර තවදුරටත් පෙන්වා දෙන්නේ;

> "....කාන්තා අධ්‍යයන පිළිබඳ පර්යේෂකයෝ, ලිංගය සමාජ ස්තරායනයෙහි පන්තියක්' ලෙස නිතර දක්වති. සමාජ ප්‍රතිමාන හා සමාජයෙහි පිරිමින්ගේ හා ගැහැනුන්ගේ සාපේක්ෂ තත්තවයෙන් පිළිඹිබු වන ස්ත්‍රී පුරුෂභාවය අනුව පවතින විසමතා ප්‍රත්‍යුත්පාදනය කිරීමට අධ්‍යාපන ආයතනවල විෂය මාලාවක් විශේෂයෙන්ම සැඟවුණු විෂය මාලාව ක්‍රියාකාරීවන බව තර්ක කළ හැකිය. ළදරුවන් හදාවඩා ගැනීමේ ක්‍රම මගින් පවුල් ව්‍යූහය තුළ මූලාරම්භය වන සමාජානුයෝජන ක්‍රියාවලිය අධ්‍යාපනය මගිනුත් තහවුරු කිරීම නිසා ගැහැනු පිරිමි දෙකොටසටම අසමාන ප්‍රතිපල ලබාදෙන අයුරු සෑම සමාජයකම දිස්වේ. එපමණක් නොව සහතික හෝ විභාගවලින් නීත්‍යානුකූල කරනු ලැබූ දැනුම හා කුසලතා ද අධ්‍යාපනය බෙදා හරියි. ඒ අනුව පවුල හා ශ්‍රම වෙළෙඳපළ අතර අතරමැදි ආයතනයක්' වශයෙන් ක්‍රියාකරමින් එය පිරිමි හා ගැහැනු කුසලතා ධාරා නියාමනය කිරීමට අධාර කරයි"[109] යනුවෙනි.

විශේෂයෙන්ම පීතෘ මූලික සමාජ නියමයන් හමුවේ මෙන්ම සංස්කෘතික නියමයන් තුළ ශ්‍රී ලාංකේය කාන්තාවන්ට උරුම වූ සමාජ අසමානතාවය සෑම ක්ෂේත්‍රයක් තුළම දුරස් කිරීමට අධ්‍යාපනය බලවත් සාධකයක් විය. නාගරික හෝ ග්‍රාමීය වශයෙන් හෝ සමාජ පංති, සංස්කෘතික බෙදීම් යන කිසිදු බලපෑමකින් තොරව අධ්‍යාපනික සුදුසුකම් මත උසස් රැකියාවන්හි නිරත වීමට කාන්තාවට ද අවකාශ සැලසුණ බැවිනි. උසස් අධ්‍යාපනය කෙරෙහි කාන්තාවන්ගේ යොමුව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී 1942 ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් පසු බටහිර නැඹුරු හොඳම ශිෂ්‍යයන් 10.1 ප්‍රතිශතයක් කාන්තාවන් බවත් නිදහස් අධ්‍යාපනය ද්වීතියික පාඨමාලාවන්හි අභ්‍යාස මාධ්‍යයෙහි වෙනස සහ නව විශ්වවිද්‍යාලයන් පිහිටුවීමත් සමගම අඩු ඉගැනීමක් ඇති විශාල ප්‍රමාණයක ග්‍රාමීය ජනගහනයක් සඳහා උසස් අධ්‍යාපනය විවෘතකර දුන් බවත් 1965

---

[107] Berstein, B. Class, codes and Control. Routledge and Kegan Paul, 1971.

[108] Bourdieu, P., & Passeron, J. Reproduction on Education,Society and Culture. London: Sage Publication, 1977.

[109] ජයවීර,ස්වර්ණා, **කාන්තා දශකය හා ශ්‍රී ලංකා කාන්තාවගේ ප්‍රගතිය,** කොළඹ, කාන්තා පර්යේෂණ කේන්ද්‍රය, 1985, පි. 53.

දී විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රමාණය දස ගුණයකින් වැඩි වූ බවත් කාන්තා ශිෂ්‍ය සංඛ්‍යාව 1970දී එහි හිණිපෙත්තටම එනම් 44.4 ප්‍රතිශතයක් දක්වා ඉහළ ගිය බවත් පෙන්වා දී තිබේ[110]. විශ්වවිද්‍යාල සඳහා ලියාපදිංචිය පිළිබඳ පහත සංඛ්‍යා දත්ත තුළින් තවදුරටත් උක්ත කාරණය තහවුරු වේ.

වගු අංක 1: විශ්වවිද්‍යාලයන්හි ශිෂ්‍ය ලියාපදිංචිය (1942 - 1984)

| වර්ෂය | එකතුව | පිරිමි | ගැහැණු | ගැහැණු ප්‍රතිශත |
|---|---|---|---|---|
| 1942 | 904 | 813 | 91 | 10.1 |
| 1945 | 1065 | 932 | 133 | 12.5 |
| 1950 | 2036 | 1655 | 381 | 18'7 |
| 1955 | 2431 | 1781 | 650 | 26.7 |
| 1960 | 4723 | 3587 | 1136 | 24.1 |
| 1965 | 14210 | 9631 | 4579 | 32'2 |
| 1970 | 11813 | 6570 | 5243 | 44.4 |
| 1975 | 12648 | 7496 | 5152 | 40'7 |
| 1980 | 17494 | 10544 | 6950 | 39.7 |
| 1984 | 18962 | 10689 | 8273 | 43.6 |

විශ්වවිද්‍යාල කොමිසමේ වාර්තා, ජාතික උසස් අධ්‍යාපන කොමිසමෙහි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ වාර්තා ඇසුරෙනි. (උපුටා ගැනීම: ජයවර්ධන, ජයවීර, වර්ෂය සඳහන් නැත, පි. 45).

මේ අනුව අධ්‍යාපනික ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගිත්වය ඉහළ මට්ටමක පවතින බව පැහැදිලි වේ. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මෙන්ම සෞඛ්‍යය ක්ෂේත්‍රය තුළ ද මෙරට කාන්තාව ලබා ඇති ප්‍රගතිය සම්ප්‍රදායිකත්වය ඉක්මවමින් කාන්තාවන් සමාජගත කිරීමට මෙන්ම ඇයගේ සමාජ වරප්‍රසාද හා තත්ත්වය ඉහළ නැංවීමට ද රුකුලක් වී ඇති බව නූතන කාන්තාව පිළිබඳ විමංසනය කරන විට පැහැදිලි වන කාරණයකි.

විශේෂයෙන්ම සම්ප්‍රදායික සමාජ යන්ත්‍රණයෙන් ඔබ්බට යමින් මෙරට කාන්තාව නූතන ශ්‍රී ලාංකික කාන්තාව බවට පරිවර්තනය වීමේ ක්‍රියාවලියේ දී ස්ත්‍රීවාදී අදහස් බොහෝ සෙයින් බලපා තිබෙන බව පැහැදිලි ය. ප්‍රධාන

[110] ජයවර්ධන, ජයවීර, එම, වර්ෂය සඳහන් නැත, පි. 43.

වශයෙන්ම ලිබරල්වාදී කාන්තාවාදිනියන් ඉදිරිපත් කළ අදහස් එහි දී වැඩි දායකත්වයක් සපයා තිබෙනු දැකිය හැකිය. ලිබරල්වාදීන්ගේ අදහස වූයේ කාන්තාවට ද සම අයිතිවාසිකම් තිබිය යුතුය යන්නය. විශේෂයෙන්ම ලිබරල්වාදී අදහස් දැරූ ස්ත්‍රීවාදීන් පෙන්වාදෙනු ලැබූයේ සමාජයේ පවත්නා මෙන්ම සමාජය විසින්ම ගොඩනගා ගනු ලැබූ ඇතැම් සමාජයාන්ත්‍රනයන් තුළ කාන්තාව අසාධාරණයකට ලක්කරනු ලැබූ බවයි. සම්ප්‍රදායිකව කාන්තාවන් අඩු භෞතික හැකියාවන්ගෙන් මෙන්ම අඩු බුද්ධි මට්ටමකින් යුක්ත වන සමාජ කොටසක් ලෙස පිළිගැනීම මෙන්ම එසේ සැලකීම කාන්තාව සමාජය විසින්ම අසාධාරණයට ලක් කළ බවට ප්‍රබල සාධකයකි. අතීත කාන්තාව අත්විඳි මෙම තත්ත්වය නූතන කාන්තාව එලෙසින්ම අත්නොවිඳිමට කාලානුරූපීව මෙරට සමාජය තුළ ඇති වූ වෙනස්වීම් මෙන්ම කාන්තාවන් වෙනුවෙන් ඉදිරිපත් වූ අදහස් යම් පමණකට හෝ සමාජගත වීම හේතු වී යැයි දැක්වීම අතිශයෝක්තියක් නොවේ. මන්දයත් පුරුෂ කේන්ද්‍රීය වූ සමාජ නියමයන් නූතනත්වය කරා එළඹීමේ දී බාධාවක් වන බැවින් සමාජ නවීකරණයට සාපේක්ෂව ආකල්පමය වෙනසක් ද ඇතිවිය යුතුය යන්න පසක් කරමින් සමාජ සමානාත්මතාවය ගොඩනැගීමට එකී අදහස් හේතු වූ බැවිණි.

එසේ වුව ද නිදහසින් පසු ශ්‍රී ලංකාවේ කාන්තාව ගේ දේශපාලන, ආර්ථික හා සමාජ යන අංශවල ප්‍රගමනය පිළිබඳ දත්ත පිරික්සීමේ දී සැලකිය යුතු සවිබලගැන්වීමක් නිරීක්ෂණය වන්නේ ද යන්න විමසා බැලිය යුතු ය. නිදහසින් පසු කාන්තාව පිළිබඳ සමාජ කතිකාව විවිධ දිශානතීන් හරහා සාකච්ඡාවට බඳුන් වූ අතර එම කතිකාවන්හි සැලකිය යුතු ප්‍රවණතාවක් පෙන්නුම් කළ අවධිය ලෙස 1970න් පසු කාලය දැක්විය හැකිය. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කළ කාන්තා දශකය (1975 - 1985) තුළ මෙරට කාන්තාව පිළිබඳ වූ සමාජ කතිකාව ප්‍රායෝගික වශයෙන් සමාජගත වීමක් පන්නුම් කරනු ලැබූයේ එම කාලය තුළ ඉදිරිපත් වූ ක්‍රියාකාරකම් කාන්තාවට ඇය පිළිබඳ හා ඇගේ සමාජ වගකීම් පිළිබඳ දැනුවත් වීමට මඟ විවර කළ බැවිනි. ඒ අනුව ඉදිරියට ආ සමාජ සංකථනය කාන්තාවට ඇයගේ සමාජ තත්ත්වය ඉහළ නංවා ගැනීමට මෙන්ම සමාජමය වශයෙන් බලගැන්වීමට ද  හේතු විය. මෙම ක්‍රියාකාරිත්වය තුළ දේශපාලන වශයෙන් කාන්තාව වෙනුවෙන් හඬ අවධි කරමින් ශ්‍රී ලාංකේය සමාජයේ කාන්තාව දේශපාලන ව්‍යූහය තුළ සීමා කර තැබූ සාධක පිළිබඳ කරුණු අනාවරණය කිරීමට කාන්තාව පිළිබඳ රචනාවන් මෙන්ම කාන්තා සංවිධානවල මූලික්තවයෙන් ක්‍රියාත්මක වූ දේශනයන් හා දැනුවත් කිරීම් යම් පමණකට හේතු විය. කාන්තා සංවිධාන තනිව හා සමූහ වශයෙන් මේ පිළිබඳ සංවාදය සමාජ ගත කළ අතරම කාන්තාවගේ දේශපාලන සහභාගිත්වය හා තීරණ ගැනීමෙහිලා ඇයට තිබූ තත්ත්වය පිළිබඳ අවධානයට ලක් කරමින් හා සමස්ත වශයෙන් කාන්තාවගේ තත්ත්වය කෙරෙහි අවධානය යොමු කරමින් කෘතීන් රචනා කෙරිණි. එම කෘතීන් හරහා මෙරට කාන්තාවගේ දේශපාලන සහභාගිත්වය පිළිබඳ ප්‍රායෝගික තත්ත්වය, ඒ තුළ ඇගේ භූමිකාව මෙන්ම ගමන් මඟ පිළිබඳ පුළුල් සංවාදයක් ගොඩනැගිණි. කාන්තාව පිළිබඳව පර්යේෂණාත්කමක දෘෂ්ටියෙන් විමංසනය කළ “CENWOR” වැනි ආයතන ඉතිහාසය තුළ කාන්තාවට හිමිව තිබූ තත්ත්වය මෙන්ම ඒ තුළ කාන්තාවට සමාජයේ හිමිව ඇති තත්ත්වය පිළිබඳ තවදුරටත් පුළුල් වූ සංවාදයක් ගොඩනැගීමට කටයුතු කරනු ලැබීය. මෙවන් පසුබිමක් තුළද ශ්‍රී ලාංකේය කාන්තාවට දේශපාලන ක්ෂේත්‍රය තුළ පැවති සැබෑ තත්ත්වය පහත සංඛ්‍යා දත්ත තුළින් වඩාත් පැහැදිලි වේ.

වගු අංක 2: ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය 1947 - 2014

| වර්ෂය | සම්පූර්ණ සංඛ්‍යාව | කාන්තා නියෝජනය | කාන්තා නියෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 1947-1952 | 101 | 3 | 3.0 |
| 1952-1956 | 101 | 2 | 2.0 |
| 1956-1959 | 101 | 4 | 4.0 |
| 1960 (අප්‍රේල්) | 157 | 3 | 1.9 |
| 1960(ජූලි)-1964 | 157 | 3 | 1.9 |
| 1965-1970 | 157 | 6 | 3.8 |
| 1970-1977 | 157 | 6 | 3.8 |
| 1977-1989 | 168 | 11 | 6.5 |
| 1989-1994 | 225 | 13 | 5.8 |
| 1994-2000 | 225 | 12 | 5.3 |
| 2000-2001 | 225 | 9 | 4.0 |
| 2001-2004 | 225 | 10 | 4.4 |
| 2004-2010 | 225 | 13 | 5.8 |
| 2010-2014 | 225 | 13 | 5.8 |

මූලාශ්‍රය: පාර්ලිමේන්තු වාර්තා

වර්ෂ 2015 සිට 2020 දක්වා කාලය තුළ ද කාන්තා නියෝජනය දහතුන් දෙනෙකි. සමස්ත ජනගහනයෙන් 50% පමණ කාන්තාවන් වන නමුත් ඇයගේ දේශපාලන සහභාගිත්වය ප්‍රතිශතයක් ලෙස සලකන විට 10% ටත් වඩා අඩු මට්ටමක පවතින බවත් එහි වර්ධනය ඉතා අඩු තත්ත්වයක පවතින බවටත් උක්ත සංඛ්‍යා දත්ත

තුළින් පැහැදිලි කර ගත හැකිය. මෙයින් පෙනී යනුයේ ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්වීම් තුළ දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා සහභාගිත්වය සැලකිය යුතු මට්ටමකට වර්ධනය වී නොමැති බවයි. මේ පිළිබඳ විමර්ශනය කළ ස්ත්‍රීවාදී පර්යේෂණ මෙන්ම පොදුවේ කාන්තාව පිළිබඳ පර්යේෂකයින් පෙන්වා දෙනුයේ;

1. දේශපාලන කාර්යය කෙරෙහි කාන්තා නියෝජනය අඩු වීමට කාන්තාවන් තුළ ඒ සඳහා ඇති අඩු අත්දැකීම් හා අඩු දැනුම හේතු වීම.
2. පවුල තුළ කාන්තාවන්ට උරුම වී ඇති වගකීම් සම්භාරය තුළ දේශපාලන කාර්යයන්හි නිරත වීමට කාලය කළමනාකරණය කර ගත නොහැකි වීම.
3. ශ්‍රී ලංකාවේ පවතින සංස්කෘතිය තුළ සාම්ප්‍රදායිකවම කාන්තාවට දේශපාලන ක්ෂේත්‍රය තුළ අඩු වැදගත්කමක් හිමි කර දී තිබීම.
4. සමාජ හා ආගමික යන්ත්‍රණය තුළ කාන්තාව ගෘහස්ථකරණයට ලක් කිරීම තුළ දේශපාලන කාර්යයන් කෙරෙහි කාන්තාවන් ප්‍රමුඛත්වය ලබා නොදීම.
5. පවතින දේශපාලන ක්‍රමවේදය තුළ කාන්තාවන්ට දීර්ඝ කාලීනව රැඳී සිටීමට නොහැකි වීම කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය අවම වීමට හේතු වී ඇති බවයි.

මෙම තත්ත්වය තුළ කාන්තාවන් දේශපාලන ක්ෂේත්‍රය තුළට අන්තර් ග්‍රහණය කිරීමේ මෙන්ම දේශපාලන ක්ෂේත්‍රය තුළ ඇය සවිබල ගැන්වීමෙහි ව්‍යාපාරයට ස්ත්‍රීවාදී දේශපාලන විද්‍යාඥයින්ගේ අවධානය යොමු වීම ඉතා වැදගත් විය. ඒ පිළිබඳ අදහස් දක්වන දේශපාලන විද්‍යාඥයින් පෙන්වා දෙන්නේ;

> "…. ස්ත්‍රීන්ට ගෘහයෙන් පිටත වැටුප් ලබන රැකියාවල නිරත වීමේ ඉඩ ප්‍රස්ථා ලැබීම, පෙරට වැඩි අධ්‍යාපන පහසුකම් හිමිවීම, පවුලේ දරුවන් සංඛ්‍යාව තීරණය කිරීමට බලපෑමේ හැකියාව ලැබීම, පෙරට වඩා පොදු ක්ෂේත්‍රයේ කටයුතුවලට සහභාගීවීමේ අවස්ථා ලැබීම සහ ඔවුන්ට සෘජුව බලපාන යම් යම් කරුණු සම්බන්දයෙන් රාජ්‍ය නීති හා ප්‍රතිපත්ති සම්පාදනයේ අවශ්‍යතාව අවබෝධ වීම සමග ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගිත්වයේ අවශ්‍යතාව ප්‍රකාශයට පත්විය. එම අවස්ථාව හා ඔවුන්ගේ දේශපාලන භූමිකා සම්බන්ධයෙන් විශේෂයෙන්ම ස්ත්‍රීවාදී දේශපාලන විද්‍යාඥයෝ අවධානය යොමු කිරීමට පටන්ගත්හ. මෙම පසුබිම මත විශේෂයෙන්ම 1970 ගණන්වලදි ස්ත්‍රී/පුරුෂ සම්භවය හා දේශපාලනය පිළිබඳ පුළුල් සංවාදයක් අරඹිණි. මෙහිදී ස්ත්‍රීය සම්බන්දයෙන් වූ සම්ප්‍රධායික අදහස් අභියෝග රැසකට ලක්විය."[111]

මේ අනුව මෙරට ස්ත්‍රීවාදී ව්‍යාපාරය තුළ ඒ ඒ ක්ෂේත්‍රයන්හි කාන්තාවන් මුහුණ දුන් ගැටලු කෙරෙහි අවධානය යොමු කළ බව පැහැදිලි වේ. දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගිත්වයේ වැදගත්කම පිළිබඳ අවධාරණය කළ ඇතැම් විද්වතුන් පෙන්වා දෙනු ලැබූයේ ඉතා ඉහලම, ඉතා වැදගත්ම තීරණ ගනු ලබන්නේ දේශපාලන මට්ටමින් බවත් එනිසා කාන්තාවන් දේශපාලන කටයුතුවල සහභාගී වීම ජාතික හා පෞද්ගලික කටයුතුවලදී ඉතා වැදගත් කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පිළිබඳ දර්ශකයක් බවයි[112]. මෙවැනි පසුබිමක් තුළ 1975න් පසු කාල වකවානුව තුළ පිළිගත් දේශපාලන පක්ෂ හා ව්‍යවස්ථාදායක සභාවල විශේෂයෙන්ම තීරණ ගන්නා මට්ටමේ දී කාන්තාවන් දේශපාලන කටයුතුවල සහභාගී වීමේ පහත වැටීමක් පෙන්වන බවත් ඊට හේතුවක් වශයෙන් පෙන්වා දී තිබෙන්නේ පවුල නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වඩා බරපතල අභියෝගයන්ට මුහුණදීමට කාන්තාවන්ට සිදුව තිබීමයි[113]. තව ද දේශපාලනය පිරිමින්ගේ කටයුත්තක් සේ පිළිගැනෙන ගතානුගතික ආකල්පය ද බලවත් බාධාවක් ලෙස පවතින බවත්

---

[111] ලියනගේ. එම, 2008, පි. 2.

[112] සිල්වා, විමලා ද, "කාන්තාව හා තීරණ ගැනීම", **කාන්තා දශකය හා ශ්‍රී ලංකා කාන්තාවගේ ප්‍රගතිය,** කොළඹ, කාන්තා පර්යේෂණ කේන්ද්‍රය, 1985, පි.225.

[113] එම, පි. 226.

පෙන්වා දී තිබේ[114]. මේ තත්ත්වය තුළ දේශපාලන කටයුතුවලට කැපවීම පූර්ණ ජීවන දර්ශනයක් සේ සලකන සටන්කාමී කාන්තාවන් ද මතු වී ආ බව දක්වා තිබේ[115]. මෙහිදී අධ්‍යාපනික වශයෙන් ඉහල මට්ටමේ සිටි කතුන් සිය අදහස් විවිධ ආකාරයෙන් සමාජගත කිරීමට පෙළඹිණි. මෙයින් පෙනී යන්නේ 1960 සහ 1970 කාලයෙන් ආරම්භව සමාජය පුරා විහි දී ගිය කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වූ කාන්තාවාදී ව්‍යාපාරය දේශපාලනය තුළ කාන්තාව ඉදිරියට ගෙන ඒමට ගත් උත්සාහයන්හි යම් සාර්ථකත්වයක් පැවති බව මෙන්ම අධ්‍යාපනය හරහා ඇය ලද සමාජ දැනුවත්භාවයද ඒ සඳහා බලපාන ලද බවයි.

මේ ආකාරයට දේශපාලනය තුළ කාන්තා නියෝජනය ඉහළ නැංවිය යුතු බවට බොහෝ දෙනා හඬ නැගුව ද වර්තමානය වනවිටත් මෙරට දේශපාලනය තුළ කාන්තා නියෝජනයේ අඩු වීමක් දක්නට ලැබීම තුළ තවදුරටත් සමාජය තුළ මේ පිළිබඳ පුළුල් සාකච්ඡාවක් ඇතිවිය යුතුව තිබෙන බව පෙනේ. විශේෂයෙන්ම කාන්තාවන්ට දේශපාලනයෙහි නිරත වීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමට ඇති අවකාශය තව තවත් පුළුල් කළ යුතු වේ. එමෙන්ම දේශපාලන ප්‍රවාහය හා සමස්ත සමාජයටම බලපැවැත්වෙන ප්‍රතිපත්තිමය හා අනෙකුත් තීරණ ගැනීමේ දී කාන්තාවගේ තත්ත්වය සමාන නොවූ බව පසක් වන අතරම ස්ත්‍රීවාදී ක්‍රියාකාරකම් හමුවේ එම අවශ්‍යතාව සමාජගත කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙසින් මෙකී අංශයන්හි කාන්තා නියෝජනය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු වූ අවස්ථාවන් දක්නට ලැබිණි.

ශ්‍රී ලාංකේය සමාජයේ ඓතිහාසික විකාසනය තුළ කාන්තා අධ්‍යාපනය අතීත අවධියට සාපේක්ෂව නිදහසින් පසු කාලපරිච්ඡේදයෙහි සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ ද දේශපාලන ක්ෂේත්‍රය තුළ ඇයගේ සහභාගිත්වය පහළ මට්ටම පැවතීම තුළ පෙනී යන්නේ විෂයානුබද්ධ අධ්‍යාපනය හරහා ලබා දෙන දැනුවත්භාවය සමාජ ක්‍රියාකාරිත්වය තුළ ප්‍රායෝගික වීමෙහි දී ආකල්පමය වශයෙන් මෙන්ම න්‍යායයික වශයෙන් ඇය එම ක්ෂේත්‍රය තුළ බලගැන්වීමට ක්‍රමවේදයක් නොපැවති බවයි. කෙසේ වුවද ගැහැනු දරුවන් ගෘහයට කේන්ද්‍ර නොකොට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඔවුන් ඉදිරියට ඒම තුළ කාන්තාවන් වශයෙන් සමාජගත වීමහි දී යම් පමණක දැනුවත්භාවයක් ඔවුන් තුළින් ප්‍රකට කිරීමෙන් පෙනී යන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා ලැබෙන දැනුම ප්‍රායෝගික ජීවිතයේ දී ධනාත්මක පසුබිමක් නිර්මාණය කරගැනීමට දායක වී ඇති බවයි.

**ආර්ථික ක්ෂේත්‍රය තුළ කාන්තාව සවිබල ගැන්වීමට අධ්‍යාපනයේ දායකත්වය**

නිදහසින් පසු ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස් වීම් අතර ආර්ථික ක්ෂේත්‍රය තුළ ඇති වූ වෙනස්කම් හා සමගාමීව කාන්තාවගේ ආර්ථික සහභාගිත්වයේ පුළුල්භාවයක් ඇතිවීම සැළකිය යුතු කාරණයක් ලෙස අවධාරණය කළ හැකිය. සම්ප්‍රදායිකව ගොඩනැගී තිබූ සමාජ හරපද්ධතීය තුළ ක්‍රියාත්මක වූ කාන්තාවන් සමාජමය හා ආර්ථික ප්‍රවාහය තුළ සීමා කරන ලද කරුණු කෙරෙහි අවධානය යොමු කළ ඇතැම් කාන්තා ක්‍රියාකාරීන් එම තත්ත්වය තුළ ඉතිහාසය පුරාවට මෙරට කතුන් අත්විඳි කටුකත්වය පිළිබඳ නැවත නැවත විමසීමට ලක් කරනු ලැබීය. එමෙන්ම නිදහසින් පසුව මෙරට තුළ ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන් තුළ කන්තා නියෝජනය නැංවීමේ වැදගත්කම අවධාරණය කෙරිණි. ආර්ථික ව්‍යූහය තුළ කාන්තාවගේ තත්ත්වය පිළිබඳ කුමාරි ජයවර්ධන විසින් කළ විමංසනයන් හා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ ස්වර්ණා ජයවීර විසින් සිදුකළ විමංසනයන් හරහා සමකාලීන අවධීන්හි කාන්තාවන් මෙකී ක්ෂේත්‍ර තුළ ක්‍රියාකළ ආකාරය මෙන්ම ප්‍රධාන ආර්ථික ධාරාව මෙන්ම අධ්‍යාපනික රටාව තුළ කාන්තාව තබා තිබූ ස්ථානය පිළිබඳ අනාවරණයන් සිදුකරනු ලැබීය. ශ්‍රී ලංකාවේ ගැහැණිය ගැන කාන්තා අධ්‍යාපන කවයේ විසි දෙවන ප්‍රකාශනය තුළ සඳහන් පහත ප්‍රකාශය තුළින් ආර්ථිකය තුළ කාන්තාව කෙරේ දැක් වූ ආකල්පය පැහැදිලි වේ.

> "ආර්ථිකව ශ්‍රී ලාංකික කතුන් තේ කර්මාන්තයෙහි නියුක්ත ශ්‍රමයන් ලෙස යෙදී සිටින අතර, නිෂ්පාදනයෙහි සහ කෘෂිකාර්මික කටයුතුවල ද ඔවුන් නියුක්ත වන නමුත් ඔවුහු යෙදවූයේ සරල

114 **එම,**
115 **එම,**

වෘත්තීන්හිය. වැටුප් ලැබීම අතින් ද සූරාකෑමකට ලක් වූහ. 1980 වර්ෂයේ දී ද, ඔවුන් නැවත වාරයක් අලුත් මුහුණුවරක් ගත් රැකියා මාර්ග මගින් සූරාකෑමකට ලක් වූ අතර එම නව වෘත්තීමය හැඩරුව ශ්‍රී ලංකාවෙහි උද්ගත වීමට තුඩුදුන්නේ නව ජාත්‍යාන්තර ශ්‍රම විභජනයෙහි ප්‍රතිඵලයක් ලෙස අඩු වැටුප් සහිත විශේෂයෙන්ම අඩු කාන්තා වැටුප් සහිත, පුළුල් සම්පත් යොදා ගැනීමේ වාසිය ප්‍රයෝජනයට ගැනීමෙන්ය. නමුත් තවමත් කාන්තාවන් සැලකෙනුයේ සමහර වර්ගයේ වැඩ කොටස් සඳහා පමණකි. මේවා සංසන්දනාත්මකව අඩු වැටුප් ලැබෙන රැකියාවන්ය. බොහෝ විට වැටුප් ලැබෙන සේවයන්හි නොයෙදෙන කාන්තාවෝ අඛණ්ඩව ජීවිකා වෘත්තියෙහි යෙදෙති. මේවා වෘත්තීන් සේවාවන් ලෙස පිළිනොගැනේ"[116].

ගෘහස්ථ කාර්යයන්ට සීමාකර සිටි මෙරට කාන්තාවන් ආර්ථිකයට දායක කර ගැනීමේ ස්වරූපය උක්ත ප්‍රකාශනයෙන් මනාව පැහැදිලි වේ. මෙවැනි පැහැදිලි කිරීම් හරහා ආර්ථිකය තුළ කාන්තාවගේ තත්ත්වය පිළිබඳ සමාජය දැනුවත් කිරීම, තව තවත් කාන්තාවන්ගේ ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීමට පුළුල් මාවතක් විවර කිරීමක් විය. සම්ප්‍රදායික සමාජ යන්ත්‍රණය තුළ පීතෘමූලික සමාජ නියාමනයන් හරහා කාන්තාව සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රවාහයන් තුළ සීමා කරන ලද ක්‍රමවේදය යටත්විජිත ප්‍රතිපත්ති හා ඉන්පසු උදා වූ කාලපරිච්ඡේදයන්හි ද පූර්වාදර්ශයන් සැපයූ බව කාන්තාවන් වෙනුවෙන් හඬ අවදි කළ විද්වතුන් පෙන්වා දෙනු ලැබීය.

> ".....යටත්විජිත පාලකයින් හඳුන්වා දෙන ලද නිෂේධ වික්ටෝරියානු මිනුම් දණ්ඩ මගින් තවදුරටත් ශක්තිමත් වූ, හම ගසන ලද පාරම්පරික ලිංග ක්‍රියා කලාපය හැරෙන්නට සැලසුම් නිෂ්පාදනයේ දී ස්ත්‍රීන් කෙරේ විශේෂ විධානයක් කිසි විටෙක නොවීය. සිදු වූයේ ඉන් ඇති වූ ප්‍රතිපත්ති වෙනස්වීම පමණි. විශාල ලෙස ව්‍යාප්ත වූ ප්‍රතිපත්තිය වූයේ කාන්තා සංකල්පය ගේ දොර සකස් කරන්නියන් හා ලිංගික වටිනාකම් මත ශ්‍රමය බෙදීමට භාජනය වූවන් ලෙසට සීමා වීම ය"[117].

ශ්‍රී ලාංකේය සමාජයේ ඓතිහාසික ගමන් මග දෙස විමසුම් දෘෂ්ටියෙන් අවධානය යොමු කරන විට කාන්තාවන්ගේ ආර්ථික සහභාගිත්වය කෘෂිකර්මාන්තය හා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි කැපී පෙනුනි. විදේශ සේවා නියුක්තිය තුළද කාන්තා සහභාගිත්වය සැලකිය යුතු මට්ටමක පැවතිනි. ඇතැම් වෘත්තීන් සම්බන්දයෙන් කාන්තාවගේ තත්ත්වය පිළිබඳ වඩාත් කතාබහට ලක් වූයේ එම වෘත්තීන් තුළ කාන්තා ශ්‍රමය සූරා කෑමට ලක්වන බව ප්‍රත්‍යක්ෂ වූ බැවිණි. විශේෂයෙන්ම නිදහස් වෙළෙඳ කලාප තුළ සුළු වැටුපකට කාන්තාවන් සේවයෙහි යෙදවීම පිළිබඳ බොහෝ කාන්තාවාදීන්ගේ අවධානය යොමු වූයේ මෙම පසුබිම තුළය. නමුත් මෙරට තුළ ඇති වූ ආර්ථික වෙනස් වීම් හමුවේ විවෘත වූ මෙම ගෘහයෙන් පරිභාහිරව ආදායම් ඉපයීමට කාන්තාවන්ට අවකාශ ලැබීම එක් පැත්තකින් සුබවාදී පියවරක් ලෙස පෙනියන්නේ සංවර්ධන කාර්යයට දායක වීමට අයට ලැබෙන අවස්ථාව නිසා පමණක් නොව වෘත්තීයමය අත්දැකීම් හරහා ඇයට ලැබෙන නව අත්දැකීම් සමාජ ප්‍රගමනයට හේතු වන බැවිණි. මෙම තත්ත්වය මත ආර්ථික ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගිත්වයේ ගුණාත්මක වර්ධනයන් ඇති කළ යුතු බව ලිබරල්වාදී දෘෂ්ටිය දැරූවන්ගේ අදහස විය.

මෙම ගෘහස්ත සිමාකරණය තුළ තවදුරටත් සංවර්ධන කාර්යයෙහිලා කාන්තාවන් දායක කර ගැනීමට ඇති ඉඩ ඇහිරීයන ආකාරය කාන්තාවාදී අධ්‍යයන හා රචනාවන් මඟින් මේ ආකාරයෙන් සමාජීය අවධානයට යොමු කරවීමේ ව්‍යාපාරයෙහි ප්‍රගමනයක් 1975 - 1985 කාලය තුළ පෙන්නුම් කරනු ලැබීය. එනම් සමානාත්මතාව සංවර්ධනය හා සාමය අරමුණු කරගනිමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය එම වසර දහය කාන්තා දශකය ලෙස හඳුන්වා දෙනු ලැබීම හරහා මෙරට තුළද කාන්තාවන් පිළිබඳ වැඩි අවධානයක් යොමු වීමයි. ඒ ඒ ක්ෂේත්‍ර තුළ කාන්තාවන් පිළිබඳ පැවති ආකල්ප එම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සිදුකළ විමර්ශනයන් මගින් අනාවරණය කිරීම

[116] ජයවර්ධන, කුමාරි, ජයවීර,ස්වර්ණා, **ශ්‍රී ලංකාවේ ගැහැණිය ගැන**, පරි. ටිකිරි දිසානායක, කාන්තා අධ්‍යාපන කවයේ 22වන ප්‍රකාශනය, (වර්ෂය සඳහන් නැත), පි.2.
[117] එම, පි.7.

විශේෂයෙන් සැලකිය යුතුය. මෙම වසර දහය තුළ ඇති වූ ප්‍රගතිය පිළිබඳ පසුව සිදුකරන ලද විමසීම් ඇසුරින් ඉදිරිපත් කෙරුණ ලිපි ලේඛනයන් තවදුරටත් කාන්තාවන්ට ඔවුන් පිළිබඳ දැනුවත්භාවයකක් ඇති කර ගැනීමට ඉවහල් විය. සංවර්ධන සැලසුම් සඳහා කාන්තා සහභාගිත්වය ඉහල නැංවීම පිළිබඳ අදහස් මෙන්ම අධ්‍යාපනික වශයෙන් කාන්තාවන් දිරි ගැන්වීමේ වැදගත්කම හා ඒ තුළින් කාන්තාවගේ සමාජ ක්‍රියාකාරිත්වය පමණක් නොව ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රයන්හි ඇයගේ සහභාගිත්වය ඉහළ නැංවීමට ඇති හැකියාව පිළිබඳ පුළුල් කතිකාවක් ගොඩනැගුන බව කිව යුතුය. නාගරික කතුන් මේ පිළිබඳ දැනුවත් බවින් යුක්තව සිටිය ද ග්‍රාමීය කතුන් තුළ තමන්ට ද ගෘහයෙන් පරිබාහිරව ආදායම් ඉපයීම හා අධ්‍යාපනික අවස්ථාවන් විවර කර ගැනීමට ඇති හැකියාව පිළිබඳ දැනුවත් කිරීම් කාන්තා සංවිධාන හරහා සිදු කළ ක්‍රියාකාරකම් යම් පමණකට හෝ ඉවහල් විය. එපමණක් නොව තවදුරටත් කාන්තාවන් සමාජය තුළ බලගැන්වීමෙහිලා පවත්නා ගැටලු පිළිබඳ සංවාදාත්මක, විචාරාත්මක හා විවේචනාත්මක දෘෂ්ටියෙන් ඉදිරිපත් වූ රචනාවන් උගත් හා බුද්ධිමත් කතුන් ඉදිරියට මෙහෙය වීමට පසුබිම සකස් වූ බව ද දක්නට ලැබිණි. එක්සත් ජාතීන්ගේ කාන්තා දශකය පිළිබඳ අදහස් දක්වන කුමාරි ජයවර්ධන පෙන්වා දෙන්නේ 1975 දී කාන්තා වර්ෂය ප්‍රකාශයට පත්කිරීම වැදගත් සාධකයක් බවත් රජය රාජ්‍ය සංවිධාන දේශපාලන පක්ෂ වෘත්තීය සමිති සහ රාජ්‍ය නොවන සංවිධාන සියල්ලම මෙය සැමරූ අතර ස්ත්‍රීවාදීන් ලංකාව පුරා යාපනයේ සිට හම්බන්තොට දක්වා ස්ත්‍රී ප්‍රශ්න සාකච්ඡා කරමින් ගිය බවත් සෑම පන්තියකටම අයත් ස්ත්‍රීන්ගෙන් ඔවුන්ට යහපත් ප්‍රතිචාර ලැබුණ බවත්ය[118]. තව ද එතෙක් පැවති ස්ත්‍රීවාදී සාහිත්‍යයන්ගේ ආභාසය ලත් දේශීය ස්ත්‍රීවාදීන් කාන්තා ප්‍රශ්න ගැන ලියන්නටත් මෙන්ම ස්ත්‍රීවාදී සාහිත්‍යය පරිවර්තනය කරන්නටත් පෙළඹුණ බවත් ස්ත්‍රීවාදී විවිධ ප්‍රවණතා නියෝජනය කළ නව සංවිධාන බිහි වූ බව ද ඇය විසින් පෙන්වා දී තිබේ[119]. කාන්තා දශකය තුළ ඇති වූ මෙම තත්ත්වය මෙරට කාන්තාව පිළිබඳ පුළුල් සමාජ කතිකාවක් ගොඩනැගීමට හේතු විය. එකී සමාජ කතිකාව කාලීනව ඇති වූ සමාජ, ආර්ථික හා දේශපාලනික වෙනස්වීම් සමග විවිධ දිශානතීන් හරහා වර්ධනය වීමක් ද දක්නට ලැබිණි. තව ද එතෙක් මෙරට තුළ ක්‍රියාත්මකව පැවති කාන්තා සංවිධාන ද කාන්තාවගේ සම අයිතිය වෙනුවෙන් උද්ඝෝෂණ දියත් කළ අතර මූලික ආර්ථික හා සමාජයීය වෙනස්කම් සඳහා වූ අරගලයන්හි අවශ්‍යතාව අවධාරණය කරනු ලැබීය. මේ අනුව ආර්ථික ක්ෂේත්‍රය තුළ කාන්තාව සවිබල ගැන්වීමහිලා අධ්‍යාපනයේ වැදගත්කම මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන් ද නව ආර්ථික ක්‍රමෝපායයන් පිළිබඳ දැනුවත් කිරීමෙහි වැදගත්කම කාන්තා ක්‍රියාකාරීන් අවධාරණය කිරීම තුළ පෙනී යන්නේ කාන්තාවන්ට සියලු ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් දැනුමක් ලබා දීම හරහා ඔවුන් ඒ ඒ ක්ෂේත්‍ර තුළ බල ගැන්වීමට වඩාත් පහසු වන බවයි. එහිදී පාසල් අධ්‍යාපනය නිම කරන හා උසස් අධ්‍යාපනයට යොමු නොවන පිරිස ආර්ථික වශයෙන් බලගැන්වීම සඳහා වන වෘතීය අධ්‍යාපනය වඩාත් පුළුල් කිරීමෙන් කාන්තාවන් තවදුරටත් ඒ ඒ ක්ෂේත්‍ර තුළ බලගැන්විය හැකිවනු ඇත.

**නිගමනය**

කාන්තාව සමාජමය වශයෙන් සවිබල ගැන්වීමෙහිලා අධ්‍යාපනයෙහි බලපෑම ක්ෂේත්‍ර කිහිපයක් තුළ හඳුනාගත හැකිය. සමාජ යන්ත්‍රණයෙහි ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය තීරණය කරන සංස්කෘතිය කුලය වැනි සාධක අබිබවමින් අධ්‍යාපනය හරහා ඇය ලබන දැනුම සහ අවබෝධය ප්‍රායෝගික වශයෙන් ශක්තිමත් සමාජ එළඹුමක් සඳහා දායක වීම වැදගත් තත්ත්වයක් ලෙස දැක්විය හැකිය. එසේම අධ්‍යාපනික තත්ත්වය පහළ මට්ටමහි සිටින කතුන් බොහොමයක් නොදැනුවත් බව හා අනවබෝධය නිසාම සමාජමය වශයෙනුත්, පෞද්ගලික වශයෙනුත් ගැටලුවලට මුහුණ දෙන අතර ආර්ථික හා දේශපාලන වශයෙන් ද එම කතුන් සමාජයේ තවතවත් පහලට තල්ලු වීම නොවැළැක්විය හැකි තත්ත්වයක් බවට පත්ව තිබේ. පීතෘ මූලික සමාජ ආකල්ප මෙන්ම ඒ ඒ සංස්කෘතීන්ට අයත්වන පරිදි ගොඩනගාගෙන ඇති සම්ප්‍රදායික සිරිත් විරිත්, ආගමික විශ්වාසයන් මෙම තත්ත්වයට අනුබල දුන් සාධක ලෙස නිදහසින් පසු සමාජ ඉතිහාසය පිරික්සීමේ දී පැහැදිලි වන කාරණයකි. සමාජ යන්ත්‍රණය, සංස්කෘතික හා ආගමික ගතිකත්වය මෙන්ම පීතෘ මූලික ආකල්ප මත සමාජ

[118] ජයවර්ධන, එම, 1985, පි. 158.
[119] එම, පි. 158

වෙනස්වීම, ඇතැම් සමාජ කණ්ඩායම් තුළ ප්‍රගමනයක් සනිටුහන් කළ ද ඇතැම් ආගමික හා සංස්කෘතික කණ්ඩායම් සම්ප්‍රදාය අතික්‍රමණය කිරීමට දක්වන මැලිකම නිසාම නූතනය වන විටත් සමාජමය වශයෙන් ඉදිරියට ඒම මන්දගාමී ස්වරූපයක් පෙන්වන බව දැකිය හැකිය. එබැවින් ප්‍රතිපත්ති සම්පාදනය සහ ඉහළ මට්ටමේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය දක්වා සමාන සහභාගිත්වයක් කාන්තා ප්‍රජාව තුළින් ද නියෝජනය කිරීමේ අවශ්‍යතාව පූරණය කිරීමට අධ්‍යාපනය හරහා කාන්තාවට අවකාශ ලබාගැනීමට ඇති හැකියාව ඉස්මතු කිරීම ඉතා වැදගත් වේ.

ආගමික හා සංස්කෘතික සම්ප්‍රධායන් තුළ දීර්ග කාලයක් ක්‍රියාත්මක වූ සමාජ ක්‍රමවේදයන් හරහා ගොඩනැගී ඇති යන්ත්‍රණයන් කෙටි කාලයක් තුළ සම්පූර්ණ වෙනසකට බඳුන් කිරීම ප්‍රායෝගිව සිදු නොවන්නක් බැවින් වර්තමානය වන විටත් මෙරට තුළ බොහෝ අංශයන්හි කාන්තා සහභාගිත්වය අවම මට්ටමක පවතිනු දැකිය හැකිය. නමුත් අධ්‍යාපනික වශයෙන් මෙරට කතුන් අත්කරගෙන තිබෙන සම තත්ත්වය තුළ වෘත්තීයමය වශයෙන් සම වැටුප් ලබන හා සම වරප්‍රසාද ලබන සැලකිය යුතු කාන්තාවන් පිරිසක් ඉදිරියට පැමිණ ඇති බව දැකිය හැකිය. තව ද ස්ත්‍රීවාදී අදහස්වල ආභාසය ලත් විද්වත් කතිකාවක් ශ්‍රී ලාංකේය සමාජය තුළ ගොඩනැගී තිබේ. ආර්ථික ක්ෂේත්‍රය තුළ කාන්තාව මුහුණ දෙන ගැටලු ආර්ථික විද්‍යා විශ්ලේෂණයන් තුළට ඇතුළත් වී තිබීම හා විරැකියාව නිසා කාන්තාව මුහුණදෙන ගැටලු මෙන්ම විවිධ සේවාවන්හි නිරත කතුන් මුහුණ දෙන ගැටලු ආදී අංශයන් පර්යේෂණාත්මක දෘෂ්ටියෙන් විමංසනය කිරීමට වර්තමානය වන විට එකී විද්වත් කතිකාව ආර්ථික ක්ෂේත්‍රය තුළ ප්‍රායෝගික වී තිබේ. එමෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ උසස් අධ්‍යාපන අවස්ථා අහිමිවන කතුන් සඳහා විවිධ වෘත්තීයමය පාඨමාලාවන් ඉදිරිපත් කිරීමේ ප්‍රායෝගික වැදගත්කම පිළිබඳ පුළුල් සංවාදයක් ගොඩනැගී තිබේ. එබැවින් කාන්තාවගේ සමාජ ප්‍රගමනය උදෙසා මෙන්ම ඇය සමාජමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා වන ධනාත්මක එළඹුම් රැසක් ස්ත්‍රීවාදී අදහස් තුළ සමාජගත වී තිබෙන බව පැහැදිලි ය. නමුත් සමාජමය වශයෙන් බලපාන තීරණ ගැනීමේ හා දේශපාලන ක්ෂේත්‍රයන්හි කාන්තා නියෝජනය වර්තමානය වන විට ද අවම තත්ත්වයක පවතින බැවින් නූතන කාන්තාවාදී ව්‍යාපාරය තම දිශානතිය ඒ කෙරෙහි යොමු කිරීමේ අවශ්‍යතාව දැඩිව පවතියි. එමෙන්ම වාර්ගිකත්වය හා සබැඳි සංස්කෘතික භාවිතයන් තුළ විද්‍යමානවන සෘණාත්මක සංකල්පවලට ප්‍රතිචාර දැක්වීම සඳහා සමාජය තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කිරීම ද වැදගත් වේ. ඒ සඳහා අධ්‍යාපනය ශක්තිමත් ප්‍රවේශයක් ලබා දෙන අතරම නිදහසින් පසු අවධියේ සිට මෙරට කාන්තාවගේ සමාජ ප්‍රගමනය පිළිබඳ සලකා බැලීමේ දී ඒ හරහා සමාජය තුළ කාන්තාවන් තවදුරටත් සවිබල ගැන්වීමට ලැබෙන දායකත්වය වඩාත් ප්‍රායෝගික බව පසක් කළ හැකිය.

**සමුද්දේශ**

ජයවර්ධන, කුමාරි, ජයවීර,ස්වර්ණා, (වර්ෂය සඳහන් නැත). *ශ්‍රී ලංකාවේ ගැහැණිය ගැන*, පරි. ටිකිරි දිසානායක, කාන්තා අධ්‍යාපන කවයේ 22වන ප්‍රකාශනය.

ජයවර්ධන,කුමාරි, (1985), "1975-1985 දශකය තුළ ස්ත්‍රීවාදී විඥාණයේ අංග සමහරක්", *කාන්තා දශකය හා ශ්‍රී ලංකා කාන්තාවගේ ප්‍රගතිය*, කොළඹ, කාන්තා පර්යේෂණ කේන්ද්‍රය, පිටු 157-169.

ජයවීර,ස්වර්ණා, (1985), *කාන්තා දශකය හා ශ්‍රී ලංකා කාන්තාවගේ ප්‍රගතිය,* කොළඹ, කාන්තා පර්යේෂණ කේන්ද්‍රය.

ලියනගේ, කමලා, (2008), දේශපාලන විද්‍යාව හා ස්ත්‍රීවාදය: න්‍යායාත්මක විශ්ලේෂණයක්, *සම්භාවනා*, ශාස්ත්‍රපීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පිටු 1-23.

සිල්වා, විමලා ද, (1985), "කාන්තාව හා තීරණ ගැනීම", *කාන්තා දශකය හා ශ්‍රී ලංකා කාන්තාවගේ ප්‍රගතිය*, කොළඹ, කාන්තා පර්යේෂණ කේන්ද්‍රය, පිටු.211-233.

Berstein, B. (1971). *Class, codes and Control.* Routledge and Kegan Paul.

Bourdieu, P., & Passeron, J. (1977). *Reproduction on Education,Society and Culture.* London: Sage Publication.

Campbell, A. (2006). *Feminism and Evolutionary Psychology.* New York: Oxford University Press.

Engels Friedrich, (1948). *The Origin of the Family, Private Property and the State,* Foreign Language Publishing House, Moscow.

Fazilah, Zaharah, Azizah, Saran, & Noor, (2011). "The Role of Education in Shaping Youth's National Identity", *Social and Behavioral Science*, pp.443-450.

Jayaweera, *Women and Education, Facets of Change*: Women in Sri Lanka, Colombo, CENWOR, 1995.

Jayawardana, K., (1985). Some Aspects of Feminist Consciousness in the Decade 1975-1985, In *UN Decade for Women: Progress and Achievements of Women in Sri Lanka*, 1975-1985, Colombo, CENWOR, 1985.

Jayawardana, K., & De Alwis, M. (2002). The contingent Politics of the Women's Movement in Sri Lanka after Independence. In S. . Jayaweera, *Women in post-Independence Sri Lanka.* New Delhi: Sage Publication.